(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 422.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 නොවැම්බර් මස 20 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3559/'13

1\.

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සහ 2013 වර්ෂ සඳහා මෙම අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය යටතේ ඇති අන් කවර හෝ ආයතනයකට / කාර්යාලයකට විශේෂඥ උපදේශකවරයකු, අනුශාසකවරයකු හෝ වෙනත් එබඳු නිලධාරියකු පත්කරනු ලැබ තිබේද;

(ii) එසේ නම්, එසේ පත් කරන ලද පත්වීම්ලාභීන්ගේ නම් සහ ඔවුන් පත් කරන ලද දිනයන් කවරේද;

(iii) ඔවුන් පත් කිරීමේ පරමාර්ථය කවරේද;

(iv) ඔවුන් වෙනුවෙන් මාසයකට වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2011 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ ඉහත (අ)(i)හි ආකාරයේ පත්කිරීම් කිසිවක් හෝ සිදු කොට තිබේද;

(ii) මේ වන විට එම පත්වීම් ක්‍රියාත්මකව පවතීද;

(iii) එසේ නම්, ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් හෝ, ඔවුන් පත් කිරීම සඳහා සලකා බලන ලද වෙනත් යම් නිර්ණායකයන් තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4404/'13

2\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ ජනවාරි මස සිට ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා කාලසීමාව තුළ රජයේ රෝහල්වල භාවිතා කර ඇති සේලයින් ප්‍රමාණය කොපමණද;

(ii) එම කාලසීමාව තුළ පෞද්ගලික රෝහල්වල සහ වෙනත් ආයතනවල භාවිතා කරන ලද සේලයින් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (i) හා (ii) හි සඳහන් සමස්ත සේලයින් ප්‍රමාණයෙන් ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලැබූ සේලයින් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සේලයින් නිෂ්පාදනය කරනු ලබන ආයතනවල නම් කවරේද;

(ii) මේ වන විට සේලයින් ආනයනය කරන රටවල් සහ ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) මෙරට සේලයින් නිෂ්පාදනය දේශීය අවශ්‍යතාවය සපුරාලීමට ප්‍රමාණවත් නොවේ නම්, වාර්ෂිකව ආනයනය කරනු ලබන සේලයින් ප්‍රමාණය කොපමණද;

(ii) 2013 වර්ෂයේදී සේලයින් ආනයනය සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය ආරම්භ කරන්නෙකු සඳහා රජය මගින් ලබා දිය හැකි සහන කවරේද;

(ii) එම සහන ලබා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5264/'14

3.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නකල්ස් වන රක්ෂිත ප්‍රදේශයේ එනසාල් වගාවේ නිරතව සිටි හත්සියයකට ආසන්න පවුල් සංඛ්‍යාවක් එම ප්‍රදේශයෙන් ඉවත් කර ඇති බවත්;

(ii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කළ නකල්ස් රක්ෂිතයේ එනසාල් වගා තහනම සහ ඉන්දියාවෙන් අධික ලෙස එනසාල් ආනයනය කිරීම අතර යම් සම්බන්ධයක් ඇති බවත්;

(iii) බ්‍රිතාන්‍ය පාලකයන්ගේ කාලයේ සිට අවුරුදු 75 කට අධික කාලයක් තිස්සේ පවුල් හයසියයකට අධික ප්‍රමාණයකගේ ආර්ථික සුබසිද්ධියට ඉවහල්ව තිබූ එම එනසාල් වගාව මේ වන විට සම්පූර්ණයෙන්ම විනාශ කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් එනසාල් වගාවට සහ එම වගාකරුවන්ගේ සුබසිද්ධියට අදාළව කිසියම් පියවරක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5425/'14

4.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ හා පෞද්ගලික ආයතනවලට සේවකයින් තාවකාලිකව බඳවා ගන්නා නීතිමය ප්‍රතිපත්ති රාමුව කවරේද;

(ii) ඔවුන් ස්ථිර කිරීමට පෙර කොපමණ කාලයක් තාවකාලික පදනම මත සේවය කළ යුතු වන්නේද;

(iii) තාවකාලිකව සේවය කරන කාලය තුළ ඔවුන්ට වැටුපට අමතරව වෙනත් ගෙවීමක් (මාසිකව හෝ රැකියා කාලය අවසන් වන විට) සිදු කිරීමට සේවාදායකයාට නෛතික බැඳීමක් තිබේද;

(iv) සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල ඔවුන් වෙත ලබා දෙන්නේද;

(v) නොඑසේ නම්, ඒ මන්ද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5486/'14

5.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී නවසීලන්තයෙන් හෝ ඕස්ට්‍රේලියාවෙන් ආනයනය කළ ජර්සි වර්ගයේ කිරි දෙනුන් සංඛ්‍යාව;

(ii) ඊට වැය කළ මුදල ඇමරිකන් ඩොලර් වලින්;

(iii) එම දෙනුන් අතරින් රෝගී වූ හා මියගිය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම දෙනුන් නුවරඑළිය ප්‍රදේශය හැර වෙනත් ප්‍රදේශවලට නොගැලපෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම දෙනුන් ආනයනය කළේ රජයේ මුදලින්ද; නැතහොත්, ණය ආධාරයක් යටතේද;

(ii) එම දෙනුන් බෙදා දුන් දිස්ත්‍රික්ක කවරේද;

(iii) දෙනුන් බෙදා දුන්නේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපළවලටද; නැතහොත්, පෞද්ගලික ගොවීන්ටද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ කිනම් ගොවිපොළවලට දෙනුන් ලබා දුන්නේද;

(v) එම දෙනුන්ගෙන් රෝගී වී හෝ මිය ගොස් ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) එසේ වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මේ වන විට නෙදර්ලන්තයෙන් කිරි දෙනුන් ඇනවුම් කර තිබේද;

(ii) එසේ නම්, ඊට වැය කරනු ලබන මුදල කොපමණද;

(iii) එය විදේශ මූලාශ්‍රවලින් ලබා ගන්නේද;

(iv) ලීටර් 30 - 40 කිරි ප්‍රමාණයක් ලබා දෙන, මෙරට දේශගුණයට ගැලපෙන ඉන්දියානු කිරි දෙනුන් සිටින බව දන්නේද;

(v) එසේ නම්, ඉන්දියාවෙන් කිරි දෙනුන් ආනයනය නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5597/'14

6\.
ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.06.15 දින හා ආසන්න දිනවලදී අළුත්ගම, දර්ගා නගරය සහ වැලිපැන්න ප්‍රදේශවල ඇතිවූ කලහකාරී තත්ත්වය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන්නේ නම්, එහි වත්මන් තත්ත්වය කවරේද;

(ii) ඉහත සිදුවීම් ආරම්භ කිරීමට හා වර්ධනය කිරීමට අනුබල දුන් අය හා පහරදීම් සිදුකළ අය හඳුනාගෙන තිබේද;

(iii) ඔවුන් කවුරුන්ද;

(iv) ඔවුන්ට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හානියට පත්වූ නිවාස, ව්‍යාපාරික ආයතන හා වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එයට අදාළව ඇස්තමේන්තුගත හා ගෙවා ඇති වන්දිවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හානිවූ නිවාස සහ ව්‍යාපාරික ස්ථාන යථා තත්ත්වයට පත්කර තිබේද;

(iv) එම සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උක්ත සිදුවීමේදී,

(i) මිය ගිය සහ තුවාලවූ සංඛ්‍යාව කොපමණද;

(ii) එක් මරණයක් වෙනුවෙන් ගෙවූ වන්දි මුදල කොපමණද;

(iii) නොඑසේ නම්, ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iv) මරණයට පත් අයගේ ළඟම ඥාතියා වෙත එම වන්දිය ලබා දී තිබේද;

(v) අවතැන්වූ සිංහල හා මුස්ලිම් පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) වාර්තාකරණයේ යෙදී සිටියදී, ප්‍රහාරයට ලක් වූ ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(vii) හානියට පත් මාධ්‍ය උපකරණ වෙනුවෙන් වන්දි ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5657/'14

7\.
ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛනයේ 'අ' පරිශිෂ්ටයේ සඳහන් ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළවන තනතුරුවලින් දෙපාර්තමේන්තු ප්‍රධානී තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම ලැයිස්තුවේ සඳහන් ඉහත ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවල පත්කිරීම් බලධරයා කවුරුන්ද;

(iii) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරුවලට පත්කිරීමේ පටිපාටිය කවරේද;

(iv) ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියට අදාළ තනතුරු සඳහා මේ වන විට පත්කර ඇති ශ්‍රී.ලං.ප.සේ. නොවන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(v) 2012.07.02 දින සිට 2014.01.01 දින දක්වා වූ කාලය තුළ පුරප්පාඩු වී තිබූ ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණියේ තනතුරු පැවති ආයතන, එම තනතුරු නාම සහ තනතුරු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා 2014 අගෝස්තු මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන ලද, සුදුසුකම් සම්පූර්ණ කර තිබූ එක් එක් නිලධාරියාගේ නම, ඔවුන් ශ්‍රී.ලං.ප.සේ. I ශ්‍රේණියට පත් වූ දිනය, පශ්චාත් උපාධිය වලංගු දිනය, එම උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය හා එම උපාධියේ විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14 සහ 15 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (විසි දෙවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (නොවැම්බර් 19 දින ප්‍රගතිය)

*2.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 13 දිනැති අංක 1875/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 968, 969, 970, 971 සහ 972 දරන සුරාබදු නිවේදන)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව,— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2014.11.19 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය. (2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/48 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/50 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 11 දිනැති අංක 1875/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 14 දිනැති අංක 1875/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 22 දිනැති අංක 1876/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 04 දිනැති අංක 1878/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පනවන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පනවන ලදුව, 2014 ඔක්තෝබර් 24 දිනැති අංක 1885/46 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.19 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ එම පනතේ 6 වැනි වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 02 දිනැති අංක 1882/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 4),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1]

*20.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ

වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*26.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

29.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

පී. හැරිසන් ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

ශ්‍රී ලංකාවේ සමාජ වැඩ වෘත්තීයවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

38.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

අල් ජමියාතුල් ඵ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ සාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---